# ජාතික ව්‍යාපාරය, ජ වි පෙ හා අයවැය

පසුගිය අවුරුදු දහයක පමණ කාලයක් තිස්සේ ජාතික ව්‍යාපාරය (පක්ෂ) දේශපාලනීකරණයකට ලක්විණි. අයවැය ඡන්දයත් සමග මේ දේශපාලනීකරණයට කෙතරම් ඉඩක් දිය යුතු ද යන්න නැවත සිතා බැලිය යුතු ය. මෙරට ජාතික ව්‍යාපාරයේ ඉතිහාසය අඩුම තරමින් පණ්ඩුල බ්‍රාහ්මණ යුගය තෙක් ගෙන ගිය හැකි ය. පණ්ඩුල බ්‍රාහ්මණයාගේ උපදෙස් පණ්ඩුකාභය කුමරුට ලැබුණි. එදා සිට අද දක්වා ම ජාතික ව්‍යාපාරය සෘජු දේශපාලනයෙන් ඉවත් ව එහෙත් රජවරුන් ඇතුළු සියළු දෙනා කෙරෙහි බලපෑම් ඇතිකරන ව්‍යාපාරයක් ලෙස පෙනී සිටියේ ය. 1817-18 යටත්විජිත විරෝධී නිදහස් සටනෙන් පසුව බ්‍රිතානීන් මෙරට සාම්ප්‍රදායික නායකත්වය මුළුමනින් ම මෙන් ඝාතනයකිරීමෙන් හා ඉතිරි පිරිස නොයෙකුත් වර්ගවල වරප්‍රසාද දෙමින් සිංහලයන්ට තමන්ගේ ම වූ සෘජු දේශපාලන නායකත්වයක් නැතිකිරීමෙන් පසු සිංහලයන්ට ඉතිරිවූයේ ජාතික ව්‍යාපාරය පමණකි. එක්දහස් හතළිස් අටේ දී ඇති වූ සිංහලයන්ගේ දෙවැනි ප්‍රධාන යටත් විජිත විරෝධී සටන හෙවත් මාතලේ හටන ශෝකාන්තයක් වූ අතර එයට සෘජු දේශපාලන නායකත්වය දීමට පුරන් අප්පු හා ගොංගාලේගොඩ බණ්ඩා පත්කර ගැනීමට එවකට ජාතික ව්‍යාපාරයට නායකත්වය දුන් භික්ෂූන් වහන්සේට හා අනෙක් අයට සිදු විය. ඉන් පසුව ජාතික ව්‍යාපාරය විසින් සෘජු දේශපාලන නායකත්වයට පත්කරනු ලැබූ පුද්ගලයා වූයේ එස් ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායක මහතා ය. අප බොහෝ අවස්ථාවල සඳහන් කර ඇති පරිදි දෙමළ ජනයාගේ මෙන් නොව සිංහලයන්ගේ ජාතික ව්‍යාපාරය දේශපාලනඥයන්ට වඩා ඉදිරියෙන් තිබී ඇත. 1954 න් පමණ පසුව මෙරට ජාතික ව්‍යාපාරය විසින් ශ්‍රී ල නි පක්ෂය සිංහලත්වයේ පක්ෂය බවට පත්කෙරිණි. එහෙත් ඒ පක්ෂය දිගින් දිගට ම ජාතික ව්‍යාපාරයට කන් දුන්නා නො වේ. බටහිරයන්ගේ බලපෑම මත 1992 දී පමණ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඒ තත්වය ආපසු හැරවීමට පවා සූදානම් විය. ඉන් පසු බලය ලබාගැනීම සඳහා, විශේෂයෙන් ම පැකේජයට විරුද්ධ අරගලයේ දී එ ජා පක්ෂය ජාතික ව්‍යාපාරයට නායකත්වය දීමට පවා ඉදිරිපත් විය. එහෙත් ජාතික ව්‍යාපාරයට කල්තබා ම ඒ අවබෝධ කර ගැනීමට හැකිවි ය.

මේ අතර තවත් වැදගත් කරුණක් සිදු විය. ඒ ජාතික ව්‍යාපාරය ම දේශපාලනීකරණයට ලක්කිරීමට අද ජාතික හෙළ උරුමය නමින් හැඳින්වෙන ව්‍යාපාරයේ පුරෝගාමී ව්‍යාපාරයක් ඉදිරිපත් වීම ය. වසර කිහිපයක් ගතවීමෙන් පසුව ජ වි පෙරමුණ ද වික්‍රමබාහු කරුණාරත්න මහතා ආදීන් සමග එක් වී කළ තම අතීත දේශපාලනයෙන් ගැල වී ජාතිකත්වය දෙසට නැඹුරුවීමට පටන්ගත්තේ ය. මේ පක්ෂ හා කණ්ඩායම්වලට එසේ නොකර සිටීමට නො හැකි විය. ජාතික ව්‍යාපාරය විසින් පුබුදුවන ලද මනසක් සහිත ව සිටි ජනතාවගේ ඡන්දය ලබාගැනීමට අඩුම තරමින් 2004 වසරින් පසුව ජාතිකත්වයට නැඹුරුවීම අවශ්‍ය විය. ජනතාවගේ මනස් පුබුදු කිරීමේ දී චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය බටහිරයන්ගේ අනුග්‍රහයෙන් දෙමළ ජාතිවාදයට පක්ෂව ගෙනගිය දේශපාලනය ද එයට විරුද්ධව බලයට පත්වීම සඳහා එ ජා පක්ෂය ගෙනගිය ක්‍රියා මාර්ගය ද ජාතික ව්‍යාපාරයේ වැඩීමට ද ආධාර විය. කුමාරතුංග මහත්මිය ලංකාවට පැමිණියේ ම ශ්‍රී ල නි පක්ෂය වෙනස්කිරීමට වුව ද ජාතික ව්‍යාපාරයේ බලපෑම මධ්‍යයෙහි ඇයට ඒ කරගත නො හැකි විය. ඇයට විරුද්ධව ගෙනගිය දේශපාලනයේ දී එ ජා පක්ෂය ජාතික ව්‍යාපාරය තමන් අතට ගැනීමට උත්සාහ කළ ද එය ද ව්‍යර්ථකිරීමට ජාතික ව්‍යාපාරයට හැකිවිය. ඒ පක්ෂයට කළහැකි එකම කාර්යය වූයේ එතෙක් ජාතික ව්‍යාපාරයේ යෙදී සිටි භික්ෂූන් වහන්සේ පස්නමක් තම පැත්තට ගැනීම පමණ ය. කෙසේ වෙතත් කුමාරතුංග මහත්මියගේ අමනොඥ දේශපාලනයේ ප්‍රතිඵලයක් ලෙසත් ජාතික ව්‍යාපාරයට ශ්‍රී ල නි පක්ෂය සම්බන්ධයෙන් අනුගමනය කළ හැකිව තිබූ පැහැදිළි ප්‍රතිපත්තියක් නොතිබීම නිසාත් 2002 මැතිවරණයෙන් එ ජා පක්ෂය ජයගත්තේ ය. 1994 දීත් ජාතික ව්‍යාපාරය සමග එකට සිටි ම එ පෙ මේ වන විට එතරම් ක්‍රියාකාරී දේශපාලනයක නිරත නොවීම ජාතික ව්‍යාපාරයට පහරක් විය. ජාතික ව්‍යාපාරයෙහි දේශපාලනය ගෙනයෑම සඳහා දේශපාලන පක්ෂයක් නොවීම හේතුවෙන් ජාතික හෙළ උරුමයේ පුරෝගාමීන්ට හා ජ වි පෙරමුණට නව දේශපාලන මහක් විවෘත විය.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ජාතික ව්‍යාපාරය පැත්තකට දමා තිබූ නමුදු හුදෙක් බලය රැකගැනීම සඳහා ඇයට විවිධ මාර්ග සෙවීමට සිදුවිය. එහි දී ඇයට ආධාරයට සිටියේ අද දේශපාලන සරණාගතයකු බවට පත් වී ඇති මංගල සමරවීර මහතා ය. රනිල් වික්‍රමසිංහ මහතාගේ ඊනියා සටන් විරාම ගිවිසුම් මැද ශ්‍රී ල නි පක්ෂය තම භූමිකාව නැවතත් භාරගැනීමට ක්‍රමයෙන් ඇදී ගියේ පක්ෂ නායකත්වය ඒ ක්‍රියා මාර්ගය අවංකව ම අනුමත කිරීම නිසා නො වේ. පක්ෂ දේශපාලනයේ ජඩ බව මැද බලයේ රැඳී සිටීමට හා බලයට ඒමට ඇතැම් ක්‍රියා මාර්ග කාට කාටත්

© Prof. Nalin De Silva

අනුගමනය කිරීමට සිදු විය. එහි ප්‍රතිඵලය වූයේ පරිවාස ආණ්ඩුව ය. ජාතික හෙළ උරුමයේ පුරෝගාමීන් මෙන් ම ජ වි පෙරමුණේ නායකයෝ ද පනස්හයේ දරුවෝ වෙති. ශ්‍රී ල නි පක්ෂයේ නායතත්වයේ ද පනස්හයේ දරුවෝ වෙති. සුදු නෙළුම් අතින් ගෙන තවලම් ගිය ද මංගල සමරවීර මහතා ඇතුළු පිරිසට ද ජාතිකත්වය පදනම් කරගනිමින් පරිවාස ආණ්ඩුවක් ස්ථාපිතකිරීමට සිදු විය. පනස්හයේ දරුවන් නැවතත් ජාතිත්වය මත පදනම් වීමේ ප්‍රතිඵලය වූයේ අවසානයේ දී මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවීමත් ශ්‍රී ල නි පක්ෂයේ නායකත්වයට පත්වීමත් ය. මෙරට දේශපාලනයේ සන්ධිස්ථානය වූයේ මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති වීමටත් වඩා ශ්‍රී ල නිපක්ෂයේ නායකයා වීම ය. එසේ නායකත්වය නිල වශයෙන් ලබාගැනීමේ දී ජනාධිපති පදවිය උපකාරී වූ බව සැබෑ ය. එහෙත් ජනාධිපති පදවියට පත්වන විටත් ඒ මහතා පක්ෂයේ නිල නොවන නායකයා විය. මහින්ද චින්තනය බිහි කිරීමෙහි ලා ජාතික ව්‍යාපාරයේ දායකත්වය අති මහත් ය. එහි දී ජාතික හෙළ උරුමය මෙන් ම ජ වි පෙරමුණ ද දැවැන්ත කාර්යභාරයක් ඉටු කෙළේ ය. එහෙත් මේ පක්ෂ දෙකම මේ වන විට ජාතික ව්‍යාපාරය දේශපාලනීකරණයට ලක්කර තිබුණි. එහි ප්‍රතිඵලය වූයේ ජනමාධ්‍ය විසින් ජාතික ව්‍යාපාරය ලෙස මේ පක්ෂ දකිනු ලැබීම ය. ඒ පක්ෂ දෙක චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගෙන් පසුව ශ්‍රී ල නි පක්ෂය නැවත ජාතිකත්වය වෙත ගෙන ඒමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කෙළේ ය. ශ්‍රී ල නි පක්ෂය කිසි විටෙක ජාතික ව්‍යාපාරය දේශපාලනීකරණයකට ලක්කර නැත. එහෙත් ඒ පක්ෂය මෙරට සිංහලත්වයේ පක්ෂය වෙයි. ජාතික ව්‍යාපාරයේ දේශපාලනය ඍජුව නොවුව ද ඒ පක්ෂය විසින් යම් ප්‍රමාණයකට ගෙන යනු ලබයි. ජාතික හෙළ උරුමය මෙන් ම ජ වි පෙරමුණ ද මේ සන්දර්භය යටතේ කළ යුත්තේ ශ්‍රී ල නි පක්ෂය තව තවත් ජාතිකත්වය දෙසට ගැනීම ය.

එහෙත් අවාසනාවකට ජ වි පෙරමුණේ ඇතැම් නායකයන්ට තම කාර්යභාරය ගැන අවබෝධයක් නැත. ඔවුන්ට අවශ්‍ය වන්නේ ජ වි පෙරමුණේ ආණ්ඩුවක් පිහිටුවීම ට ය. එහෙත් ඔවුන් තේරුම් නොගන්නා කරුණ නම් ශ්‍රී ල නි පක්ෂයත් සමග ඇති සම්බන්ධකම් ඉවත්කළ හොත් ඒ ඔවුන්ගේ අවසානය බව ය. ජ වි පෙරමුණ ල ස ස ප හෝ කොමියුනිස්ට් පක්ෂය හෝ වැන්නක් නො වේ. අටුවන් බැහැපු මාක්ස්වාදීන් තවමත් ජ වි පෙරමුණෙහි සිටිය ද, එහි මුල සිට ම ජාතිකත්වයක් විය. ඒ පක්ෂයට තවමත් මුළුමනින්ම ජාතිකත්වය වැළඳ ගැනීමට හැකි වී නැත. ඔවුන්ගෙන් ඇතමකු තවමත් සිතන්නේ මාක්ස්වාදීන්ගේ කසිකබල් යථාර්ථය, ඊනියා විද්‍යාව, ආර්ථිකයට ඌනනය කිරීම, ඊනියා පංති සටන ආදිය ඔස්සේ ලෝකය දැකිය හැකිය කියා ය. ජ වි පෙරමුණෙහි අද ඇත්තේ ජාතිකත්වය හා මාක්ස්වාදය අතර කඹ ඇදිල්ලකි. ඒ සටනින් පක්ෂ අභ්‍යන්තරයෙහි කසිකබල් මාක්ස්වාදය තාවකාලික ව ජයගෙන ඇත. ජාතිකත්වයේ ප්‍රවාද තේරුම්ගැනීමට නායකත්වයේ බොහෝ දෙනෙක් අකමැති වෙති. ඔවුන් වසර එකහමාරකට පමණ පෙර මගේ ලෝකය එරෙහිව ඊනියා යථාර්ථයකට පක්ෂ පොතක් පළ කෙළේ ද මේ අකමැත්ත හා මාක්ස් වන්දනාවට ඔවුන්ගේ තවමත් ඇති කැමැත්ත නිසා ය. ඔවුන් පළ කළ පොතේ කතුවරයාට තමන් කියන්නේ කුමක් ද යන්න ගැනවත් කිසිදු අවබෝධයක් නැති බව පේරාදෙණි විශ්ව විද්‍යාල සිසුහු කියා දුන්හ. ජ වි පෙ තවදුරටත් මාක්ස්වාදී වීමට ගියහොත් නම් එයට සිදුවන්නේ ල ස ස ප හා කො ප මෙන් ඇවිදන මළමිණියක් බවට පත්වීමට ය. ලංකාවේ අනෙක් මාක්ස්වාදී පක්ෂ නො ඇවිදින මළමිණි වෙයි. ඒ මළමිණි බෙහෙත් ගල්වා පවත්වාගෙන යනු ලබන්නේ බටහිර මුදලින් ය.

ජ වි පෙරමුණට මාක්ස්වාදයෙන් නොකැඩී පැවැත්මක් නැත. එහි නායකයෝ ඒ බව දනිති. අයවැයට ඡන්දය දීම සඳහා ඒ පක්ෂය ඉදිරිපත්කළ කොන්දේසි අතර බඩුමිළ අඩුකිරීමක් ගැන හෝ දූෂණය ගැන හෝ සඳහන් කිසිවක් නො වී ය. ඒ කොන්දේසි හතර ජාතිකත්වය මත පදනම් වී ය. ඒ ජාතිකත්වය පදනම් කරගත් ජනතාව ආකර්ෂණය කිරීමට ය. එහෙත් ජනතාව ඉන් නො රැවටෙයි. මේ අයවැය ප්‍රධාන වශයෙන් ම කොටින්ට එරෙහි මෙහෙයුම් සඳහා මුදල් ලබාගැනීමට ය. අයවැයෙන් ආරක්ෂක කටයුතු සඳහා පසුගිය වතාවේ මෙන් දෙගුණයකට ආසන්න මුදලක් වෙන්කර ඇත. ජ වි පෙ විරුද්ධව ඡන්දය දුන්නේ ඒ අයවැයට ය. එහෙත් එයින් අදහස් කරන්නේ ජාතික හෙළ උරුමය කියා ඇති ආකාරයට ජ වි පෙරමුණට වඩා මුස්ලිම් කොංග්‍රසය හා තොණ්ඩමන්ගේ කම්කරු කොංග්‍රසය දේශප්‍රේමී වන බව නො වේ. ජ වි පෙරමුණට තම වැරදි නිවැරදි කර ගැනීමට තවමත් කල් තිබේ. එහෙත් ඒ වැරදි නිවැරදි කරගැනීමට මිස ජනතාව රැවටීමට නො වේ. ජ වි පෙ මෙන් ම ජාතික හෙළ උරුමය ද අවබෝධකර ගත යුතු කරුණ නම් ජාතික ව්‍යාපාරයට අද තමන්ගේ ම ප්‍රවාද ඇති බවත් ඒ කාගේවත් අතකොළුවක් නොවන බවත් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva